**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 ජුලි 10 දින එළඹි අංක 5417-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.9(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ දේශගුණික අවදානම සඳහා විවෘත වන ජනතාව සහ වත්කම් පීඩාවට පත්වීම අවම කිරීම සඳහා සහ ආපදා වලට ඵලදායීව ප්‍රතිචාර දැක්වීමට ග්‍රාහකයාගේ ධාරිතාවය වැඩි දියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,617 කට සමාන එජඩො මිලියන 111.8 ක් වන අතර එයින් රු.මිලියන 14,382 කට සමාන එජඩො මිලියන 110 ක් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වි තිබුණි. ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් 2014 අගෝස්තු 05 දින ආරම්භ කරන ලද අතර 2019 මැයි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා

පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඔ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය කාර්යසාධනය

-------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------------

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ දී 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | ඒජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | ඒජඩො මිලියන | රු.මිලියන | ඒජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | 110.0 | 14,382 | 1,825 | 9.95 | 1,300 | 10.26 | 1,342 |
| ශ්‍රී ලං ර | 1.8 | 235 | 25 | 0.13 | 17 | 0.23 | 31 |
| එකතුව | 111.8 | 14,617 | 1,850 | 10.08 | 1,317 | 10.49 | 1,373 |

ව්‍යාපෘතියේ සම්පූර්ණ කාල පරිච්ඡේදය තුළ මූල්‍ය ගිවිසුම යටතේ වෙන් කරන ලද ණය මුදල් උපයෝජනය කිරීමට හා ව්‍යාපෘතියේ කාර්යයන් පහසුවෙන් මෙහෙයුම් කිරීමට හැකිවන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයට ණය මුදල් ප්‍රශස්ථ ලෙස උපයෝජනය සඳහා රු.මිලියන 2,800 ක සාමාන්‍ය වෙන් කිරීමක් වාර්ෂිකව සැපයිය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 1,825 ක වෙන් කිරීමක් පමණක් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා කරන ලද වෙන් කිරීමෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,300 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසාන කොටසේදී උපයෝජනය නොකළ ණය මුදල් සමුච්චිත වීමෙන් අපතේ යාම් සහ සාවද්‍ය පරිහරණයන් ආදිය සඳහා ඉඩ ප්‍රස්ථා ඇතිවීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය විය.

### 3.2 භෞතික ප්‍රගතිය

දේශගුණික අව බලපෑම් පහසුවෙන් ප්‍රකෘති තත්ත්වයට පත්වීමේ වැඩි ආර්ථිකයක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘතියේ කාර්යයන් ප්‍රධාන වශයෙන් ඉලක්ක කරනු ලබන අතර නිම්න භූමි සංවර්ධන ආයෝජන සැලැස්ම, දේශගුණ ප්‍රත්‍යස්ථිති යටිතල පහසුකම් වැඩි කිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහාය හා හදිසි අසම්භාව්‍යයන්ට ප්‍රතිචාර යන ප්‍රධාන සංරචක හතරකින් ව්‍යාපෘතිය සමන්විත වේ. පහත සඳහන් කරුණු හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්යයන් ආරම්භ කරන ලද දිනයේ සිට මාස 17 ක් ගතවීමෙන් පසුවද 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ එක් එක් සංරචකයන් යටතේ ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ මන්දගාමී ප්‍රගතියක් නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘතියේ කාර්යයන් පහසුවෙන් ක්‍රියාත්මක වීම සඳහා පරිපාලන හා නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති නියාමන ඒකක කාර්යාලයක් 2015 දෙසැම්බර් වන විටත් වෙනම ස්ථානයක ස්ථාපිත කර නොතිබුණි. තවද සමාජ විද්‍යාඥ, පරිසරවේදී හා ප්‍රසම්පාදන විශේෂඥ යන ප්‍රධාන තනතුරු සඳහා සුදුසු විශේෂඥයන් සහ උපයෝගී කාර්ය මණ්ඩලයේ වෙනත් ඇතැම් තනතුරු සඳහා ඌනතාවයන් සහිතව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යය වන ද්‍රෝණි 10 ක් සඳහා ආයෝජන සැලසුම් පිළියෙල කිරීම හා සංවර්ධනය කිරීම සඳහා උපදේශකවරුන්ට කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 වනවිටත් කටයුතු කර නොතිබුණි. තවද, 2015 සැප්තැම්බර් මාසයේදී ගුවන් මැනීම් කටයුතු සඳහා අදාල බලධාරීන්ට ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණද ඒ පිළිබඳ සතුටුදායක ප්‍රගතියක් ලැබී නොතිබුණි.

(ඇ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය උපදේශක කාර්ය මණ්ඩල ඌනතාවයක් සහිතව ක්‍රියාත්මක වේ. එහි ප්‍රතිඵලයක් ලෙස නායයාම් අවදානමින් පීඩාවට පත්ව තිබෙන මහනුවර දිස්ත්‍රික්කයේ පාසැල් 18 කින් පාසැල් 13 ක බෑවුම් ස්ථායිතාවය සඳහා කාර්යයන් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් පිරිනැමීම පිළිබඳ ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක පැවතුණි. කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරුන් බඳවා ගැනීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් පියවර ගෙන තිබුණද, බෑවුම් ස්ථායිතාවය පිළිබඳ කාර්යයන් සඳහා උපදේශකවරුන්ගේ මෙන්ම කොන්ත්‍රාත්කරුවන්ගේ පළපුරුද්ද නොමැති වීම හේතුවෙන් කෙටි කාලයක් තුළදී ව්‍යාපෘතියේ උපදේශක සේවා කඩිනම් කිරීමට නොහැකි වී ඇත.

(ඈ) නායයාම් වැළැක්වීම හා ප්‍රවාහනය අඛණ්ඩව තහවුරු කිරීමට කොන්ත්‍රාත් පැකේජ 09 ක් යටතේ පාලම් පුනරුත්ථාපනය කිරීමට හා පැකේජ 17 ක් යටතේ මාර්ග දෙපස බෑවුම් ස්ථායිතාවය සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය මැදිහත් වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී පැකේජ 03 ක් යටතේ පාලම් පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර ඉන් නැදිමාල-බොරලැස්ගමුව මාර්ගයේ පාලම් පුනරුත්ථාපන වැඩ පිළිබඳ ප්‍රගතිය, දුරකථන මාර්ග හා ජල නළ මාර්ග ආදි උපයෝගී සේවා මාරු කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඉලක්කයන්ට වඩා පසුපසින් පැවතුණි. තවද මාර්ග දෙපස බෑවුම් ස්ථායීතාවය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියට මෙන්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට විශේෂඥ දැනුම නොමැති වීම හේතුවෙන් මහනුවර-මහියංගනය මාර්ගයේ මාර්ග දෙපස බෑවුම් ස්ථායීතාවය සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත් පැකේජ 03 ක් මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පාලනය**

නැගෙනහිර, උතුරුමැද, වයඹ, දකුණු හා ඌව පළාත්වල ජල ගැලීම් හා නියඟය අවම කිරීමේ ව්‍යාපෘති කිහිපයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබුණි. දකුණු පළාතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තිස්සමහාරාම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද අවම කිරීමේ කාර්යයන් පිළිබඳව විගණකවරුන් විසින් කරන ලද වැඩ බිම් පරීක්ෂණ වලදී, යෝධ වැව හා තිස්ස වැව පිළිබඳ අවම කිරීම් ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතිය විසින් ඉදි කරන ලද බෙදාහැරීම් ඇළ මාර්ගවල පැති බැම්වල ජලය කාන්දු වීම් නිරීක්ෂණය විය. නිම කරන ලද වැඩ පිළිබඳ තත්ත්වය හා තිරසාරත්වය තහවුරු කරගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වැඩ පිළිබඳ අධීක්ෂණ කාර්යයන් ප්‍රමාණවත්ව සිදුකර නොතිබූ බවට සාක්ෂි එයින් සපයනු ලැබේ. තවද වීරකැටිය වාරිමාර්ග දෙපාර්තමේන්තු කාර්යාලය විසින් අවම කිරීම් ව්‍යාපෘති 35 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අපේක්ෂා කර තිබූ බවත් ඉන් අවම කිරීම්

ව්‍යාපෘති 25 ක් සඳහා පමණක් සැලසුම් වැඩ හා පිරිවැය ඇස්තමේන්තු සකස් කර තිබූ බවත් අවම කිරීම් ව්‍යාපෘති 09 ක් යටතේ ඉදිකිරීම් වැඩ සමාලෝචිත වර්ෂය තුළ නිමකර තිබූ බවත් නිරීක්ෂණය විය.

### 3.4 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

---------------------------------

ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන කාර්යයන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙකු හා ගණකාධිකාරිවරයෙකු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු සහ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් පත් කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ හා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ විගණන නිලධාරින් තිදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන කමිටුවක් මගින් ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලට අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ ප්‍රමාණාත්මක සොයාගැනීම් සිදු කිරීමට හැකිවන පරිදි විස්තරාත්මක විමර්ශනයන් සිදුකර නොතිබූ බව අනාවරණය විය. තවද ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ඉහත සඳහන් සමහර නිලධාරින් ඇතුළත් වන බැවින් ව්‍යාපෘතියේ මෙහෙයුම් පිළිබඳ ස්වාධීන සමාලෝචනයන් සිදු නොකෙරේ. එබැවින් මුදල් රෙගුලාසි 134(3) හි නියම කරන ලද පරිදි අභ්‍යන්තර විගණන කාර්යයන් ප්‍රමාණාත්මකව සිදුකර නොතිබුණි.